# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම් අංක 06 -2020
## මව්බස

Name / Index No :.......................................................... **Grade 3**

**2020.05.13 සිට 2020.05.19 දක්වා කරවන්න.**

**3 ශ්‍රේණිය සියලුම පන්ති සඳහා - දෙවන වාරය**

දෙවන වාරයේ 2020/05/13 දින සිට 2020/05/19 දින දක්වා මව්බස වැඩ පැවරුම.

වැඩ පැවරුම සිදුකිරීම සඳහා උපදෙස්,

- ❖ මෙම වැඩ පැවරුමේ සිට දිනය යොදා දිනට නියමිත වැඩ මව්බස ලිවීම පොතේ කරවන්න. පිළිවෙළින් අලවන්න.
- ❖ මෙම පැවරුමේ ඇතැම් කොටස් " සිංහල පැවරම් " ( ඡේද කපන පොත ) හි තිබේ. එම පොතෙන් එම කොටස දරුවා ලවාම කපා පිළිතුරු ලියා අලවන්න.
- ❖ අසා ලිවීම අදාල පොතේ සිදු කරවන්න.
- ❖ දරුවා පැවරුම සිදුකර අවසාන වූ පසු සහය වන වැඩිහිටියා විසින් වැරදි යමක් වේ නම් එය යටින් තද නිල් පැහැ පාට පැන්සලෙන් යටින් ඉරක් අඳින්න. එයට ඉදිරියෙන් දරුවා ලවාම නිවැරදි පිළිතුරු ලියවන්න.

**2020/05/13 දිනට**



## නොගැළපෙන රෝද



- ❖ දරුවා ලවාම මව්බස ලිවීම පොතේ පහත ප්‍රශ්න හා පිළිතුරු ලියවන්න.

01. පහත ප්‍රශ්න සඳහා පාඩම ඇසුරින් පිළිතුරු ලියන්න.

1) කතාවේ සඳහන් යාළුවෝ හතර දෙනා කව්ද?
2) පඳුරකින් එළියට පැන්නේ කවුද?
3) එයාගේ නම කුමක්ද?
4) කරත්තයේ හිමිකරු කවුද?
5) කරත්තය තිබුණේ කොහේද?
6) කරත්තය තල්ලු කිරීමට අපහසු වූයේ ඇයි?
7) යහළුවන් ගෙන ආ රෝද වලින් සැදුවේ කුමක්ද?
   - රූං රූං පැංචා -
   - ඉඳිකටුමුදියන්සේ -
   - බකබක අප්පුහාමි -
   - හඬලන රාල -
8) පිනුම්හාමිට යාළුවන් ගෙන් ලැබුණු තෑගි මොනවාද?

Richmond College - Grade 3 - 2020

**2020/05/14 දිනට සිංහල වැඩ පොත 17 හා 18 පිටු**



## පාඩම් අංක 04. මගේ රට

- **අවබෝධය**
  - **පාඩම කියවා උත්තර ලියන්න.**
    1. පාන්දරට ඇසෙන්නේ මොනවා ද?
    2. වනමල් පෙති පාවෙන්නේ කොහේ ද?
    3. උසට උසේ පෙනෙන්නේ මොනවා ද?
    4. මේ කවි පන්තියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?
  - **පාඩම කියවා හරි නම් 3 ලකුණ ද වැරදි නම් ශ ලකුණ ද වරහන් තුළ යොදන්න.**
    1. සිරි ලංකා දීපය පුංචි අපට සිරි සැප දෙයි. ( )
    2. ඕලු නෙලුම් ගංගාවල පිපී වැනෙයි. ( )
    3. උස කඳු වලාකුළුවල ගෑවෙයි. ( )
    4. සමන් පිච්ච පොකුරු හඳපානේ නැළවෙයි. ( )
    5. පලතුරු පැසී ඉදී සුවඳ නො දෙයි. ( )

**2020/05/15 දිනට සිංහල වැඩ පොත 32 හා 33 පිටු**



## පාඩම් අංක 04. නොගැළපෙන රෝද

- **අවබෝධය**
  - **පාඩම කියවා උත්තර ලියන්න.**
    1. යාළුවෝ හතර දෙනා කැලෑවට ගියේ ඇයි?
    2. යාළුවන් දුටු කරත්තය කාගේ ද?
    3. මේ කරත්තය ගෙදර ගෙන යමු කියලා කිවුවේ කවුද?
    4. යාළුවෝ හතර දෙනාට කරත්තය තල්ලු කරන්න බැරි වුණේ ඇයි?
    5. පිනුම් හාමිට ලැජ්ජා හිතුණේ ඇයි?

- **ක්‍රියාකාරකම** 2
  - **ගැළපෙන සේ යා කරන්න.**

| | |
|---|---|
| රුංරුං පැංචා | ඉත්තෑවා |
| බක බක අප්පුහාමි | මැස්සා |
| ඉඳිකටු මුදියන්සේ | කුකුළා |
| හඬලන රාල | හාවා |
| පිනුම් හාමි | ගෙම්බා |



Richmond College - Grade 3 – 2020



- **ක්‍රියාකාරකම** 3
  - **රෝදවලින් යාළුවන් හැදූ දේවල් ලියන්න.**

    රුංරුං පැංචා -
    බක බක අප්පුහාමි -
    ඉඳිකටු මුදියන්සේ -
    හඬලන රාල -

- **ක්‍රියාකාරකම** 4
  - **ගැළපෙන ක්‍රියාකාරකම වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

    (නූල් ඇඹරුවා/ හිනා වුණා/ එළවළු කොටුවට වතුර දැම්මා/ දරකඩාගෙන ආවා/ පිටි ඇඹරුවා)

    i. බක බක අප්පුහාමි ..........................................................
    ii. ඉඳිකටු මුදියන්සේ ..........................................................
    iii. හඬලන රාළ ..........................................................
    iv. රුං රුං පැංචා ..........................................................
    v. පිනුම් හාමි ..........................................................

- **ක්‍රියාකාරකම** 5
  - **යාළුවන් පිනුම් හාමිට දුන් දේවල් නිවැරදිව යා කරන්න.**

| | |
|---|---|
| රුංරුං පැංචා | රස කැවිලි |
| බක බක අප්පුහාමි | කැරට් අලයක් |
| ඉඳිකටු මුදියන්සේ | මේස් කුට්ටමක් |
| හඬලන රාල | ඇපල් ගෙඩියක් |

- **ක්‍රියාකාරකම** 6
  - **චිත්‍රවලට ගැළපෙන වගන්ති යොදා කතාව කියවන්න.**

| | | | |
|---|---|---|---|
| අල්ල ගන්න හදන කොට ම බැලුම් බෝලෙ පිපිරුණා | බැලුම් බෝලෙ හුළං වැදී මේසෙ යටට පෙරළුණා | බලු පැටියා බය වීලා දොර මුල්ලේ හැංගුණා | බලු පැටියා එය දැකලා හෙමින් හෙමින් ළං වුණා. |



| | | | |
|---|---|---|---|
| බැලුම් බෝලෙ හුළං වැදී මේසෙ යටට පෙරළුණා | | | |

Richmond College - Grade 3 - 202

**2020/05/19 දින**

- දෙදෙනෙක් අතර ඇති වන කතා බහක් " සංවාදයක් " වන බව පැහැදිලි කරන්න.
  (මෙම කොටස"සිංහල පැවරම්" හි තිබේ. එම පොතෙන් එම කොටස කපා වැඩිහිටියා විසින් කිහිපවරක් කියවන්න.)

සංවාද.......

### අපි හොඳ යාළුවෝ

අඹගස : තාරක පුතා මොකද අද පාඩම් කරන්න එන්න පරක්කු වුණේ ? මම මේ මඟ බල බලා සිටියේ.

තාරක : ගුරුතුමී ගෙදර වැඩට ගණන් ටිකක් දුන්නා. මම ගණන් ටික හදලා ආවේ.

අඹගස : අදත් පුතා ආවේ පාඩම් කරන්න නේ ද ?

තාරක : ඔව් ඔව් අද මම කියවීම් පොත අරගෙන ආවේ. 'ගස්වැල් සුමිතුරෝ' කියන කවි පාඩම් කරන්න.

අඹගස : ඒක හොඳයි. මම ගැන කියන තොරතුරුත් තියෙනව ද ? කියන්නකෝ බලන්න ලස්සනට.

තාරක : කෝ අද ගිරා යාළුවා. වෙනදට නම් මෙතනට ඇවිල්ලා.

44

ගිරවා : ඉන්නවා. ඉන්නවා . . . මම මේ අඹ අත්ත උඩ. ඔයාලා දෙන්නගේ කතාව මට ඇහුණා.

තාරක : එහෙනම් දෙන්නම දුන් අහගෙන ඉන්න. මම කවි කියනවා.

බලන බලන හැම    තැනක ම  
කොළ පාටින් ගස්    ගොඩයි  
ගස් සෙවණේ සිටින    විට දී  
ගස්වැල් මිතුරන්    වගෙයි

පුංචි පුංචි ගස් ලොකු    වී  
දළු මල් පල    හටගනියි  
ඒ මල් පල සැමට ම    දී  
මිතුදම තව වැඩි    කරයි

ගිරවා : හරි ම ලස්සනයි. ගස් ගැන කවි ඇහෙන කොටත් සතුටු යි.

අඹගස : ඔව්. ඔව්. තාරක පුතා ලස්සනට කවි කිවුවා.

ගිරවා : තාරක පුතා අද අඹ කැවෙත් නැහැ නේද ?

තාරක : තව ම කැවේ නැහැ. ඔයාලත් එක්ක කතා කරන එක ඊට වඩා සතුටු යි.

ගිරවා : මම අඹ කඩල දෙන්න ද?

අඹගස : ඔව් ගිරා යාළුවේ. තාරක පුතාට අඹ කඩලා දෙන්න.

තාරක : නංගිටයි, මල්ලිටයි, මටයි ගෙඩි තුනක් තිබුණා ම ඇති.

අඹගස : තාරක පුතා හරි ම හොඳයි. හැම දා ම නංගිටයි, මල්ලිටයි අඹ ගෙනියනවා.

තාරක : ස්තුති යි ගිරා යාළුවේ. මට අඹ දුන්නට අඹ ගසටත් බොහෝ ම ස්තුති යි.

අඹගස : තාරක පුතා පරිස්සමින් ගෙදර යන්න. හෙටත් පාඩම් කරන්න එන්න.

ගිරවා : ඔව් හෙටත් එන්න. අපි දෙන්න ම බලාගෙන ඉන්නවා.

- ❖ සංවාදයෙන් දරුවන්ගේ ජීවිතයට ගතහැකි ආදර්ශ ශ්‍රවණයට ඔබට එවා ඇති වට්ස් Audio Clip එක අසන්න සලස්වන්න.
- ❖ සංවාදය කියවීමෙන් පසුව දරුවා ගෙන් පහත ප්‍රශ්න විමසා පිළිතුරු වාචිකව ලබාගන්න.

  01. මෙම සංවාදයෙහි සිටින අය කවුද?
  02. තාරක අඹගස ළඟට එන්නේ කුමකටද?
  03. අඹ කැඩුවේ කවුද?
  04. තාරක අඹ බෙදා ගත්තේ කා සමඟද?
  05. මෙම සංවාදයෙන් අපට ගතහැකි ආදර්ශ මොනවාද?

- ❖ සංවාදය මව්බස පොතේ අලවන්න.